ගරු අමාත්‍යතුමා
மாண்புமிகு அமைச்சர்
Hon. Minister
Tel.: +94 11 2435248
Fax: +94 11 2390885
E-mail : minister@industry.gov.lk

ලේකම්
செயலாளர்
Secretary
Tel.: +94 11 2436123
+94 11 2436124
Fax: +94 11 2449402

අමාත්‍යාංශය
அமைச்சு
Ministry
Tel.: +94 11 2392149
+94 11 2392150
Web: www.industry.gov.lk
Fax: +94 11 2390941/ 2332444

විද්‍යුත් තැපැල
மின்னஞ்சல்
E-mail
secretary@industry.gov.lk

**කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය**
**கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு**
**Ministry of Industry and Entrepreneurship Development**

තැ. පෙ. 570, 73/1, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව./ த.பெ. இல. 570, 73/1, காலி வீதி, கொழும்பு 03, இலங்கை.
P. O. Box 570, 73/1, Galle Road, Colombo 03, Sri Lanka.

මගේ අංකය / எனது இல. / My No. MI/PD III/06/මාර්ගෝපදේශ

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2026.08. 31

කර්මාන්ත මාර්ගෝපදේශ අංක : 01/2026

**<u>භූ සම්පත් කැණීම් පිළිබඳ දිස්ත්‍රික් අධීක්ෂණ කමිටුවෙහි ක්‍රියාකාරීත්වය සඳහා වන මාර්ගෝපදේශය</u>**

අංක අමප/26/1298/810/040 හා 2026.07.06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමත කරන ලද ඉදිකිරීම් කර්මාන්තය සඳහා භාවිතා කරන ඛනිජ කැණීම්, ප්‍රවාහනය සහ වෙළඳාම පිළිබඳ කාර්ය සංග්‍රහයේ විධිවිධාන අනුව භූ සම්පත් කැණීම් පිළිබඳ දිස්ත්‍රික් අධීක්ෂණ කමිටුව ක්‍රියා කළ යුතු අතර මෙම කමිටුවෙහි ක්‍රියාකාරීත්වය සුමටව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට පහත සඳහන් මාර්ගෝපදේශයන් නිකුත් කරමි.

**1. මූලික විෂය පථය සහ අරමුණ**

**1.1.** කළුගල්, බොරළු, පස්, වැලි සහ මැටි කැණීම්, ප්‍රවාහන සහ වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම.

**1.2.** සියලුම නියාමන ක්‍රියාමාර්ග, අනුමැතීන් සහ තීරණ, 2009 අංක 66 දරන පනතින් සංශෝධිත, 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත සහ ඒ යටතේ සාදන ලද රෙගුලාසිවලට අනුකූලව සිදු කිරීම.

**2. කමිටු සංයුතිය**

- **සභාපති:** දිස්ත්‍රික් ලේකම්
- **සම්බන්ධීකාරක :** දිස්ත්‍රික් කැණීම් ඉංජිනේරු / ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරු
- **නිත්‍ය සාමාජිකයින් ලෙස කටයුතු කරන ආයතන:**
    - මධ්‍යම පරිසර අධිකාරිය/ වයඹ පළාත් පරිසර අධිකාරිය (වයඹ පළාත තුළ දී පමණක් )
    - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
    - නාගරික සංවර්ධන අධිකාරිය
    - ප්‍රාදේශීය ලේකම්
    - ශ්‍රී ලංකා පොලීසිය

- අවශ්‍යතාවය මත කැඳවිය හැකි නිලධාරීන්:
    - අවශ්‍යතාවය මත කාර්ය සංග්‍රහයේ උපලේඛන 01 හි සඳහන් ඕනෑම අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනයක නිලධාරීන් කමිටුවට කැඳවීමට කමිටු සභාපතිවරයාට බලතල ඇත.
    - මෙම කමිටුවට පළාත් පාලන ආයතන කැඳවීමේදී එම ආයතනවල නාගරික කොමසාරිස්/ සභා ලේකම්වරු පමණක් කැඳවිය යුතුය.
    - රාජ්‍ය ආයතනයක් නියෝජනය නොකරන කිසිදු තැනැත්තෙකුට හෝ පාර්ශවයකට කිසිදු හේතුවක් මත මෙම කමිටුවට සහභාගී වීමට හෝ සම්බන්ධ වීමට අවසර නැත.

## 3. කමිටු රැස්වීම් සහ පරිපාලන ක්‍රියාපටිපාටිය

**3.1.** කමිටු සභාපති විසින් වර්ෂයට අදාළව කමිටු රැස්වීම් කාලසටහන කමිටු සාමාජිකයින් වෙත පූර්වයෙන් ලබා දිය යුතු අතර, එම කාලසටහන අනුව සෑම මසකට වරක් කමිටුව රැස් කළ යුතු ය.

**3.2.** කමිටු සඳහා වර්ෂයේ දින නියම කිරීමෙන් පසුව එම දිනයන් වෙනස් නොකර සිටීමට හැකිතාක් දුරට කටයුතු කළ යුතුය. වර්ෂය ආරම්භයේ පළමු සති දෙක තුළ කමිටු සභාපති විසින් එම වර්ෂයට අදාළව සැලසුම් කළ දිනයන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ ප්‍රධාන කාර්යාලයට එවිය යුතුය. එම සැලසුම් කළ දිනට කමිටු රැස්වීම් පැවැත්විය යුතුය.

**3.3.** තව ද, අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ට සැලසුම් සහගතව හා ඵලදායී ලෙස සහභාගීවීමට හැකියාව ලැබෙන පරිදි කමිටු රැස්වීම පැවැත්වෙන දිනට අවම වශයෙන් සතියකට පෙර ඒ බව දිස්ත්‍රික් කැණීම් ඉංජිනේරු / ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරු විසින් දැන්විය යුතුය.

**3.4.** යම් මාසයකට අදාළව පවත්වන කමිටු වාරයට අමතරව අවශ්‍යතාවය පරිදි කමිටු රැස්වීම් පැවැත්වීමට කමිටු සභාපතිට හැකියාව ඇත.

**3.5.** දිස්ත්‍රික්කයේ පවත්වනු ලබන ප්‍රථම කමිටු රැස්වීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමට අදාළ සියලුම රාජ්‍ය ආයතනවල නිලධාරීන් කැඳවීමට කමිටු සභාපති විසින් කටයුතු කළ යුතු ය.

**3.6.** ආරම්භක රැස්වීමෙන් පසු පවත්වනු ලබන රැස්වීම් වාර සඳහා එදිනට ඉදිරිපත්වී ඇති ගැටළුවලට අදාල රාජ්‍ය ආයතන පමණක් කැඳවීමට කමිටු සභාපති විමසා දිස්ත්‍රික් කැණීම් ඉංජිනේරු / ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරු විසින් කටයුතු කළ යුතු ය.

**3.7.** කමිටු සභාපති විමසා දිස්ත්‍රික් කැණීම් ඉංජිනේරු / ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරු විසින් න්‍යාය පත්‍රය සකස් කළ යුතුය.

**3.8.** සියලු ව්‍යවස්ථාපිත / රාජ්‍ය ආයතන විසින්, සාකච්ඡා කිරීමට ඇති ගැටලු රැස්වීම පැවැත්වීමට නියම කරගන්නා ලද දිනයට, රාජකාරි දින 07කට පෙර ඊමේල් (Email) මගින් දිස්ත්‍රික් කැණීම් ඉංජිනේරුවරයාටද පිටපත් සහිතව, කමිටු සභාපති වෙත යොමු කළ යුතුය.

**3.9.** භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත ලැබෙන ගැටලු පිළිබඳ තොරතුරු ද රැස්වීම පැවැත්වීමට නියම කරගන්නා ලද දිනයට, රාජකාරි දින 07කට පෙර ඊමේල් (Email) මගින් අදාළ දිස්ත්‍රික්කයේ කමිටු සභාපති වෙත යොමු කළ යුතුය.

**3.10.** ඒ අනුව, එකී කරුණුවලට අදාළව කැඳවිය යුතු නිලධාරීන්, කමිටු සභාපතිවරයා විසින් තීරණය කර නියමිත දිනයට රැස්වීම සඳහා කැඳවිය යුතු ය.

**3.11.** කමිටු වෙත ලැබී ඇති ගැටලුවලට පරිබාහිරව කැණීම හා එයට අදාලව පැනනගින අතිරේක ගැටලු ද කමිටු සභාපතිවරයාගේ අනුමැතිය මත සාකච්ඡාවට ගත හැකිය.

**3.12.** සියලු වාර්තා ලිඛිතව හා පටිගතකර තබා ගැනීමේ වගකීම දිස්ත්‍රික් කැණීම් ඉංජිනේරු / ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරු සතු වේ. රැස්වීමේ දී ගනු ලැබූ තීරණයන් ඇතුළත් කමිටු වාර්තාව අදාළ නිශ්චිත ආයතන වෙත දෘඩ හෝ මෘදු පිටපතක් රැස්වීම පවත්වා රාජකාරි දින 07ක් ඇතුළත යැවිය යුතුය. එසේම එහි පිටපත් සෑම අවස්ථාවකම, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත යොමු කළ යුතුය.

**3.13.** කඩිනම් සන්නිවේදනය උදෙසා කමිටු සභාපති විසින් WhatsApp සමූහයක් නිර්මාණය කළ යුතු අතර, එහි පරිපාලකවරයා (Administrator) කමිටු සභාපති හා දිස්ත්‍රික් කැණීම් ඉංජිනේරු / ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරු විසින් දැරිය යුතු ය.

## 4. කමිටුවේ කාර්යයභාරය

### 4.1. අයදුම්පත්‍ර සම්බන්ධයෙන් කටයුතු කිරීම හා නව කැනීම් ස්ථාන හඳුනා ගැනීම

**4.1.1.** 2026 සැප්තැම්බර් 01 දින සිට, කාර්යාංශය වෙත ලැබෙන කැණීම් බලපත්‍ර අයදුම්පත්‍ර (නව අයදුම්පත්‍ර/ අළුත් කිරීම් අයදුම්පත්‍ර/දීර්ඝ කිරීම් ඉල්ලීම්) සහ විශේෂ අවසරපත්‍ර සඳහා ලැබෙන ලිඛිත ඉල්ලීම්, මෙම කමිටුවේ එකඟතාවය ලබා ගැනීමට යොමු කළ යුතුය. බලපත්‍රය නිකුත් කිරීමේ ව්‍යවස්ථාපිත බලය අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සතු වේ.

**4.1.2.** දිස්ත්‍රික් කැණීම් ඉංජිනේරු / ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරු විසින් කාර්යාංශය වෙත යොමු කරන ලද අයදුම්පත්වල නාම ලේඛනයක් හා නිකුත් කරන ලද බලපත්‍රවල නාම ලේඛනයක් දිස්ත්‍රික් වශයෙන් පවත්වාගෙන යායුතු අතර එම ලේඛනය යාවත්කාලීන කර මාසිකව කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

**4.1.3.** කාර්යාංශය විසින් නිකුත් කරන ලද සියළු බලපත්‍රවල තොරතුරු, හා ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත්‍ර වල තොරතුරු ලේඛනයක් මාසිකව අදාල දිස්ත්‍රික් කමිටු සභාපති වෙත ලබා දිය යුතු ය. මෙහි සම්බන්ධීකරණ කටයුතු දිස්ත්‍රික් කැණීම් ඉංජිනේරු / ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරු විසින් සිදු කළ යුතුය.

**4.1.4.** කමිටුව විසින් සාකච්ජා කළ අයදුම්පත්‍ර වලට අදාළව අවශ්‍ය නිෂ්කාශන නියමිත කාල සීමාව තුළ සම්පූර්ණ වී නොමැති විටක දී එම අයදුම්පත්‍ර සම්බන්ධව දිස්ත්‍රික් කැණීම් ඉංජිනේරු / ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරු විසින් කමිටුවට වාර්තා කළ යුතුය. කමිටුව විසින් එම ගැටලු සාකච්ජා කර ඉදිරි පියවර ගැනීමට කටයුතු කළ යුතුය.

**4.1.5.** අදාල ආයතනවල සහභාගීත්වය සහිතව දිස්ත්‍රික්කය තුළ පවතින කැණීම් ස්ථාන හා අවකාශ හඳුනා ගෙන එම ස්ථාන ගැසට් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු කමිටු නිර්දේශ සහිතව කාර්යාංශයට යොමු කල යුතුය. ඒ අනුව දිස්ත්‍රික්කයේ පවත්නා භූ සම්පත් සහිත ස්ථාන සිතියම් ගත කොට ප්‍රකාශයට පත් කිරීම කාර්යාංශය විසින් සිදු කල යුතුය.

**4.1.6.** නිකුත් කරන බලපත්‍ර මත සිදු කරනු ලබන කැනීම් විධිමත් පරිදි සිදුකරනු ලබන බවට කමිටුව විසින් පසුවිපරම් කල යුතු අතර ඒ පිළිබඳ ප්‍රගති වාර්තාවක් වාර්ෂිකව කාර්යංශයට ඉදිරිපත් කල යුතුය. තව ද, කාර්යංශය විසින් එම වාර්තා ප්‍රකාශයට පත් කල යුතුය.

**4.2. පාරිසරික ගැටළු හා මහජන විරෝධතා සම්බන්ධව කටයුතු කිරීම**

**4.2.1.** භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කර ඇති කැණීම් බලපත්‍රවලට අදාළව යම් මහජන විරෝධතාවයක් හෝ පාරිසරික ගැටළු පැනනැගී ඇති විටක එවැනි බලපත්‍ර සම්බන්ධව කමිටුව විසින් සාකච්ඡා කළ යුතු අතර එහිදී ගනු ලබන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා කමිටු සභාපති විසින් නිර්දේශ, වාර්තා කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සහ අදාල ආයතන ප්‍රධානීන් වෙත යොමු කළ යුතු ය.

**4.2.2.** නීත්‍යානුකූල කැණීම බලපත්‍රයක් සහිත කැණීම් කටයුත්තක් සම්බන්ධයෙන් යම් මහජන නොසන්සුන්තාවයක් ඇති වූ අවස්ථාවක දී ප්‍රාදේශීය ලේකම් විසින් අදාළ සියලු ව්‍යවස්ථාපිත / රාජ්‍ය ආයතන හා පාර්ශවකාර නියෝජිතයන් සමඟ ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකර ලබාදෙන නිරීක්ෂණ හා නිර්දේශයන්, දිස්ත්‍රික් කැණීම් ඉංජිනේරු විසින් දිස්ත්‍රික් අධීක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

**4.2.3.** සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් සිදුවන අනවසර කැණීම් ක්‍රියාකාරකම් පිළිබඳ ලේඛනයක් මාසිකව අදාල දිස්ත්‍රික් කමිටු සභාපති වෙත ලබා දිය යුතු ය.

**4.2.4.** අනවසර කැණීම් සම්බන්ධව යම් තොරතුරු, ව්‍යවස්ථාපිත / රාජ්‍ය ආයතන වෙත ලැබී ඇති අවස්ථාවක එම තොරතුරු පිළිබඳව කමිටුව විසින් සාකච්ඡා කර එවැනි අනවසර කැණීම් පාලනය සඳහා සුදුසු කඩිනම් පියවර ගත යුතු ය.

**5.** දිස්ත්‍රික් අධීක්ෂණ කමිටුවේ දී තීරණ ලබා දිය නොහැකි සියලු ගැටලු "භූ සම්පත් පිළිබඳ ජාතික අධීක්ෂණ කමිටුව" වෙත යොමු කළ යුතු ය.

**6. වෙනත් කරුණු**

**6.1. සම්බන්ධීකරණ නිලධාරීන් පත් කිරීම:**
කමිටුවේ කටයුතු සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සමඟ තොරතුරු හුවමාරුව සුමටව සිදුකිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු අනෙකුත් ව්‍යවස්ථාපිත / රාජ්‍ය ආයතන සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට සුදුසු නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කළ යුතු ය.

**7.** මෙ පිළිබඳව වැඩිදුර විස්තර හෝ කරුණු ලබා ගැනීම අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක : 011-2432705 (අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති සංවර්ධන) / 011- 2432243 (නියෝජ්‍ය අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති සංවර්ධන) මඟින් ලබා ගත හැක.

ඉහත මාර්ගෝපදේශයන් ක්‍රියාත්මක කිරීම මඟින් දේශීය ඉදිකිරීම් කර්මාන්තය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය කඩිනමින් සාධාරණ මිලකට ලබා දීමටත්, පාරිසරික හා සාමාජීය ගැටළු අවම කර ගැනීමටත්, දේශීය ඉදිකිරීම් කර්මාන්තය තිරසාරව පවත්වා ගැනීමටත් සියලු ව්‍යවස්ථාපිත / රාජ්‍ය ආයතනවල සාමූහික වගකීමක් ලෙස සළකා කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

Jayasundara

ජේ.එම්.තිලකා ජයසුන්දර
ලේකම්